www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බැංකු නියාමන පනත පිලිබඳව ඔබාමා වෝල් වීදියට යලි සහතික වෙයි

## Obama reassures Wall Street on bank regulation bill

**2010 අප්‍රේල් 23**

කොන්ග්‍රසය තුලින් ක්‍රියාවට දැමෙන බැංකු නියාමන ප්‍රතිසංස්කරන මගින් වෝල් වීදියේ ලාභ සහ බෝනස් බාධාවට ලක් නොකෙරෙනු ඇත යන පනිවිඩය වෝල් වීදියට දීමට ජනාධිපති බැරක් ඔබාමා බ්‍රහස්පතින්දා මැන්හැටන් වෙතට ගියේය.

කූපර් සංගම් ප්‍රේක්ෂාගාරයේ අසුන් ගෙන සිටි සුපිරි බැංකුකරුවන් "කර්මාන්ත ක්ෂේත්‍රයේ යෝධයන්" ලෙස හඳුන්වමින් ඔවුන් ඉදිරියේ මැනවින් සැකසූ සුවිනීත දේශනයක් හරහා විරෝධතා අත් හරින ලෙසත් ඊනියා ප්‍රතිසංස්කරන සම්මත කරවා ගැනීමට "අප හා එක්වන" ලෙසත් ඔබාමා ඉල්ලා සිටියේය. එහි ඇඟවුම වන්නේ ධවල මන්දිරය සහ කොන්ග්‍රසය තුල සිටින ඩිමොක්‍රටිකයන් දැනටමත් බැංකුකරුවන් විසින් විරෝධය පල කල නීති වලින් බොහොමයක් ඉවත් කරගෙන ඇති බව හා තවදුරටත් ඔවුන්ට සහන සැලසීමට සූදානම්ව සිටි බවයි.

කතාව පැවත්වුනේ සුරැකුම්පත් හා විනිමය කොමිසම (එස්ඊසී) විසින් වෝල් වීදියේ වඩාත්ම ලාභ උපයන බැංකුව වන ගෝල්ඩ්මන් සැක් බැංකුවට චෝදනා ඉදිරිපත් කොට සතියක්වත් ගත වීමට පෙරය. තම සේවාදායකයන්ට වංචා කල බවටත් එමගින් 2007 වසරේ අවමුඛ නිවාස වෙලඳ පොල බිඳ වැටීමට රුකුල් දුන් බවටත් ගෝල්ඩ්මන් සැක් චෝදනා ලැබීය. ඔබාමා එම චෝදනා ගැන කිසිවක් සඳහන් නොකලාක් මෙන්ම වෝල් වීදිය ද අන්තර්ගත වූ සාපරාධී ක්‍රියාවන් සම්බන්ධයෙන් ඔහු විසින් සඳහන් කල "වගකීමේ අසමර්ථතාව" කුමක්දැයි පැහැදිලි නොකලේය.

රැස්වීම් සභාවේ ඔබාමා ආයාචනා කලවුන් අතර එස්ඊසීයට තම අවඥාව සහ විරුද්ධත්වය අවධාරනය කිරීම සඳහා එම අවස්ථාවට සහභාගී වූ ගෝල්ඩ්මන්හි ප්‍රධාන විධායක නිලධාරී ලොයිඩ් බ්ලැන්ක්ෆීන් සිටියේය.

එමෙන්ම ඉහලම බැංකු පහ 2010 ප්‍රථම මාස තුන සඳහා ඒකාබද්ධ ලාභය වසයෙන් -පෙර වසරට වඩා දැවැන්ත වැඩිවීමක් සලකුනු කල - ඩොලර් බිලියන 15ක් වාර්තා කිරීමෙන් ගතවූයේ සතියකි.

ගෝල්ඩ්මන් චෝදනාවෙන් එලිදරව් කෙරෙන පරිදි මෙම ලාභයන්, එක්සත් ජනපදයේ සහ ලෝකය පුරා මිලියන ගනනාවක් විරැකියාවට සහ දුප්පත්කමට ඇද දැමුනු මූල්‍ය පද්ධතියේ බිඳ වැටීමට උපකාරී වූ යෝධ වංචාව සමග ද, ඩොලර් ට්‍රිලියන ගනනින් ඇප බඳිනු ලැබූ බදු ගෙවන්නන්ගේ මුදල් සහ ෆෙඩරල් රිසර්ව් බැංකුවෙන් නිකුත් කෙරුනු මුලුමනින්ම පාහේ නිදහස් නය සමග ද බැඳී ඇත.

ධනවාදයට තම දන්ඩ නමස්කාරය සහතික කරනු වස් ඔබාමා වෙහෙසුනේය. "නිදහස් වෙලඳපොලේ බලය කෙරෙහි මම විස්වාසය තබමි" හෙතෙම ප්‍රකාශ කලේය. "ශක්තිමත් මූල්‍ය අංශයක් කෙරෙහි මම විස්වාසය රඳවමි...." ඔහුගේ මූල්‍ය ප්‍රතිසංස්කරනය වෝල් වීදිය මත බරපතල අවහිර කිරීම් නොපටවනු ඇති බව සහතික කිරීමට ඔහු සඳහන් කලේ, "අර්බුදයට එරෙහිව ගනු ලැබූ සාමාන්‍ය ආරක්ෂනයන්ගෙන් පවා නිදහස් වූ වෙලඳපොලවල් සහ ව්‍යවසාය සහ නව්‍යකරනය වලක්වන දැඩි නීතිවලින් අවහිර කරනු ලැබූ වෙලඳපොලවල් යන දෙවර්ගය අතරින් තෝරා ගැනීමක් අපට නැත" යන්නයි.

තමන්ම දායක වී නිර්මානය කෙරුනු සමාජ ව්‍යසනය සඳහා එකදු බැංකුකරුවෙකු හෝ වෙලෙන්දෙකු හෝ වගකිව යුතුයැයි ඔබාමා යෝජනා කලේ නැත. දෙමසකට පෙර එක්සත් ජනපද වානිජ මන්ඩලය අමතා කෙරුනු කතාවක දී රුඩ් දිවයිනේ දිලිඳු පාසැල් දිස්ත්‍රික්කයක ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් සේවයෙන් පහ කිරීම ධනාත්මක අධ්‍යාපනික "ප්‍රතිසංස්කරන" පියවරක් වසයෙන් ඔබාමා විසින් ඔජ වැඩීය. එහිදී ඔහු කියා සිටියේ "වගකීම පිලිබඳ හැඟීමක් තිබිය යුතු" බවයි.

ඔබාමා සහ කොන්ග්‍රස් ඩිමොක්‍රටිකයන් ඔවුන්ගේ නියාමන යෝජනාවන් මහා අවපාත සමයේ රූස්වෙල්ට් පාලානාධිකාරිය විසින් ක්‍රියාවට දැමූ බැංකු පියවරයන්ට සමානවූ වඩාත් පුලුල් ප්‍රතිසංස්කරනයක් වසයෙන් පූර්න නරුමත්වයෙන් යුක්තව ඉදිරිපත් කරන්නේ මාධ්‍යවල සහාය ද සහිතව ය.

යථාර්තය නම්, සෙනෙට් පියවර, පසුගිය දෙසැම්බර් මස නියෝජිත මංත්‍රී මන්ඩලය මගින් සම්මත කල පනත මෙන්, ආන්ඩුවේ ආයතන විසින් මූල්‍ය සමාගම් අධීක්ෂනය කරන ක්‍රමවේදයන්ගේ යම් සුලු වෙනස්කම් යෝජනා කර තිබුන ද, 1930 ගනන්වලදී බලාත්මක කරන ලද නියාමන යාන්ත්‍රනය කඩා බිඳ දමමින් පසුගිය දශක තුනේ දී ගෙන ගිය බැංකු නියාමනහරනය ආපසු හැරවීමට කිසිවක් කර නැත. එය ඇමෙරිකානු පාලක පන්තියේ ලාභ සහ පෞද්ගලික ධනය සමුච්ඡයවීමේ කේන්ද්‍රීය ක්‍රියාවලිය බවට පත්වූ මූල්‍යමය සමපේක්ෂනය තහනම් කිරීමට තබා සීමා කිරීමටවත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරනයන් හඳුන්වා දී නැත.

විධායකයන්ට කරන ගෙවීම් සීමා කිරීමට හෝ බුන් නය හුවමාරුව, නය පොරොන්දු පැහැර හැරීම, මූල්‍යමය බිඳ වැටීමේදී හා ගෝලීය අවපාතයේදී ප්‍රමුඛ භූමිකාවක් ඉටුකල ව්‍යුහගත ආයෝජන වාහකයන් සහ සමපේක්ෂනයේ අනෙකුත් ආගන්තුක ක්‍රමවේදයන් තහනම් කිරීම ඔබාමා සහ කොන්ග්‍රස් ඩිමොක්‍රටිකයන් විසින් ප්‍රතික්ෂේප කර තිබේ. වෝල් වීදියේ සුපිරි බැංකුවල ප්‍රමුඛ ලාභ මූලාශ්‍රයක් වන ව්‍යුත්පන්න වෙලඳපොලවල් සම්බන්ධයෙන් ගත් කල ඒවා හැසිරවීමට යොදා ඇති විධිවිධානයන්, වැරදි කර බේරී යාමට ඉඩ සලසන කඩතොලු සහ හිදැස්වලින් ගහනය. කවර මෝටර් රථ ගනුදෙනුවක් සම්බන්ධයෙන් හෝ සියයට අනූ අටක් බැංකු සම්බන්ධයෙන් හෝ කටයුතු කිරීමට මූල්‍ය පාරිභෝගික ආරක්ෂන දේහයට බලයක් නොමැති අතර, එය ෆෙඩරල් රිසව් බැංකුවෙහි නිෂේධ බලයට යටත් වෙනු ඇත.

කොන්ග්‍රස් මන්ඩල සහ සෙනෙට් මන්ඩල පනත්වල වඩාත් වැදගත් නව්‍ය කාරනය වන්නේ තම අසමර්ථතාවන් හේතුවෙන් පද්ධතිමය බිඳ වැටීමක් මුදා හැරිය හැකි රක්ෂන සමාගම් සහ අනෙකුත් බැංකු නොවන ආයතන ද ඇතුලත් දැවන්ත මූල්‍ය සමාගම් ආන්ඩුවේ වියදමින් පුනර්ජීවනය කිරීම සඳහා ක්‍රියාදාමයක් ස්ථාපිත කිරීමයි. මෙම පනත් මගින් සිදු කෙරෙනු ඇත්තේ "අසමත්වීම දරාගත නොහැකි තරම් සුවිසල්" මූල්‍යමය සමාගම්වල නිමා කිරීම සහ බදු ගෙවන්නන්ගේ මුදලින් අනාගතයේදී ද ඇප බැඳීම් සිදු කෙරෙන බවට සහතිකවීමකි.

එහි කිසිදු කරුනක් නැත. යෝජනාව විසින් බැංකු විධායකයින්, කොටස් හිමියන් සහ නය හිමියන්ගේ අවශ්‍යතාවන් සහ සමස්තයක් වසයෙන් මූල්‍යමය ප්‍රභූවේ ධනය සපුරාම මහජන මුදලින් සුරක්ෂිත කිරීමට ආන්ඩුවේ ගලවා ගැනීමේ මෙහෙයුම් ආයතනික ගත කෙරෙනු ඇත. එය "ව්‍යාපාරයන් කරගෙන යන ආකාරයට" අඛන්ඩව කරගෙන යාම සඳහා බැංකු සහ ආයෝජකයන්ට අවසර දීම මගින් නියත ප්‍රතිවිපාකයන්, එනම් 2008 වසරේ මූල්‍යමය බිඳ වැටීමට අනුකූල තවත් මූල්‍යමය අර්බුදයක්, සූදානම් කරමින් සිටින අතරේ බැංකු පද්ධතිය පුද්ගලික අයිතියේම තැබීමට තිර කොට තිබේ.

බ්‍රහස්පතින්දා දින ඔහුගේ කතාවේදී, "ප්‍රතිසංස්කරනය සඳහා ඡන්දයක් යනු බදු ගෙවන්නන්ගේ මුදලින් ඇප බැඳීම් අත්හිටුවීමට යොදන ඡන්දයකි"යි ඔබාමා සඳහන් කලේය. මෙය පචයකි. මන්ත්‍රී මන්ඩලය විසින් සම්මත කල පාලන තන්ත්‍රයේ පිටුබලය ලත් පනත, මගින් "උග්‍ර ආර්ථික සන්නිපාත කාලයන්හි දී මූල්‍යමය අස්ථාවරභාවය වැලක්වීමට... නය හෝ ඇප සහතික කිරීමේ අවස්ථාවන් පුලුල් කිරීමට" ෆෙඩරල් තැන්පතු රක්ෂන සංස්ථාවට බලය පවරනු ඇත. මෙහි දී එම සංස්ථාව භාන්ඩාගාර ලේකම් සහ ෆෙඩරල් රිසර්ව්හි අනුමැතියට පමනක් යටත් කෙරෙනු ඇත. අනාගත ඇප බැඳීම් සඳහා බදු ගෙවන්නන්ගේ මුදල් යොදා ගැනීමට පිරිනැමූ හිස් චෙක් පතක් වසයෙන් මෙය සැලකිය හැක.

ඔබාමා වෝල් වීදියට නාස් ලනුව දමනවා වෙනුවට බුෂ් පාලානාධිකාරියේ පිලිවෙත් අඛන්ඩව ඉදිරියට ගෙන යමින් දැවැන්ත මූල්‍යමය සංගතවල බලාධිකාරිය සවි ගන්වා තිබේ. සමස්ත බැංකු වත්කම් වලින් සුපිරි බැංකු 10 ට අයත් කොටස 2000 වර්ෂයේ සියයට 44 වූ අතර එය 2009 වසර වන විට සියයට 58 දක්වා ඉහල නැගුනි. 1990 වර්ෂයේ එම අගය සියයට 24 කි.

මෙය වනාහි, ඇමරිකන් ජනතාවගෙන් අනවරතව සොරකම් කිරීමට වෝල් වීදියට දුන් අවසර පත්‍රයක් විනා අන් කිසිවක් නොවේ. මෙවැන්නක් පැනනැගිය හැක්කේ දූෂනය සහ අල්ලසින් ගහන වූ ද සෑම අතින්ම බලගතු මූල්‍යමය ධූරාවලියක් විසින් ආධිපත්‍ය දරන්නාවූ ද දේශපාලන පද්ධතියකිනි. මූල්‍යමය ප්‍රතිසංස්කරන සම්බන්ධයෙන් කොන්ග්‍රසයට බලපෑම් කිරීම සඳහා මූල්‍යමය කර්මාන්තය මේ දක්වා ඩොලර් මිලියන 455ක් වැය කර තිබේ.

මේ අයුරින්, සුරැකුම් සහ ආයෝජන කර්මාන්තය 2010 මැතිවරන චක්‍රයට ඩොලර් මිලියන 34කට වඩා බෙදා දී තිබේ. ඒටී ඇන්ඩ් ටී යන බැංකුවට අනතුරුව දේශපාලන මෙහෙයුම්වලට මුදල් ආධාර පිරිනැමූ දෙවන විශාලතම බැංකුව වන්නේ ගෝල්ඩ්මන් සැක් ය. 1989 සිට බැංකුවේ දේශපාලනික ක්‍රියාකාරී කමිටුව සහ කාර්ය මන්ඩලය මැතිවරන උද්ඝෝෂන ආධාර වසයෙන් ඩිමොක්‍රටික් ඡන්ද අපේක්ෂකයන් ලද සමස්ත ආධාරවලින් තුනෙන් දෙකක් හෙවත් ඩොලර් මිලියන 31.6ක් පිරිනමා ඇත.

ඔබාමාගේ ජනාධිපතිවරන මෙහෙයුමට මූල්‍යමය කර්මාන්තය ඩොලර් මිලියන 15ක මුදල් ප්‍රමානයක් ආධාර කලේය. ඩොලර් මිලියන 1කට ආසන්න ප්‍රමානයකට ආධාර පිරිනැමූ ගෝල්ඩ්මන් ඔබාමාගේ තනි විශාලතම අනුග්‍රාහයකයා විය.

ඔබාමාගේ ධවල මන්දිර උපදේශකයාව සිටි ග්‍රෙග් ක්‍රේග්, එස්ඊසීයේ චෝදනාවට එරෙහිව තම සමාගම ආරක්ෂා කරගැනීමට ගෝල්ඩ්මන් සැක් විසින් ජනවාරි වන තෙක් සේවයේ යොදා ගෙන තිබීම, වෝල් වීදිය සහ ධවල මන්දිරය අතර සබඳතාවන් පිලිබඳ එක් ඇඟවුමකි.

බැරී ග්‍රේ

© www.wsws.org